

# දඹුල්ලේ කඩුල්ල

'තමන් පුතුන් හට උරුමවූ පුත් පෙම්මා
වටින් පිටින් එන්න කෙරෙහි ද නම්මා'
(එස්. මහින්ද හිමි)

අවුරුදු තිහක ත්‍රස්තවාදී 'මාර යුද්ධය' අවසන් වී ජාතික සමඟිය අත්‍යවශ්‍ය වූ මේ අවධියේ ඓතිහාසික දඹුල්ලෙන් තවත් 'කරච්චලයක්' ඇති වුණාද? ඇති කළාද? උත්තරය කුමක් වුවත් මෙය ලත් තැනම ලොප් කළ යුතුය.
පෘතුගීසි පාලන සමයේ ලංකාවේ හා අසල්වැසි කේරලයේ දේශප්‍රේමී ජනතාව බටහිර ආක්‍රමණිකයන්ට විරුද්ධව සංග්‍රාම ගණනාවකම යෙදුණහ. මේ අතින් දරුණුම මුහුදු සටන් මෙහෙයවූවෝ මායාදුන්නේ හා ඔහු පුත් ටිකිරි බණ්ඩා (1 වෙනි රාජසිංහ) ය. ඒ සටන් වලදී මලයාලි මුස්ලිම් ජාතික කුංජාලි මරික්කාර් සහ සහීඩ් මරික්කාර් මායාදුන්නේගේ සහයට සටන් කළ බව ඉතිහාසගතය. පසුව මලබාරයේ රජු විසින් පෘතුගීසීන්ට පාවාදෙනු ලැබූ කුංජාලි මරික්කාර් ගෝවේදී දස වද දී මරා දමනු ලැබීය.

ඉන්දියාවේ නිදහසින් පසු කුංජාලි මරික්කාර්ගේ නම ජාතික වීර ලැයිස්තුවට ඇතුළත් වූ අතර ඔහු සිහි කිරීමට නම් කරන ලද ඉන්දියානු නාවික හමුදාවේ ෂහී කුංජාලි මරික්කාර් නමැති නෞකාව අදත් ඉන්දීය ධජය යටතේ යාත්‍රා කරයි.

ලංකාවේ හා ඉන්දියාවේ ඓතිහාසික තොරතුරු අනුව ඉස්ලාම් භක්තිකයන් වූ යෝනක ප්‍රජාව දිගින් දිගටම පෘතුගීසීන්ට විරුද්ධව සටන් කළ බව පැහැදිලිය. මේ නිසා පෘතුගීසි පාලනය පැවැති වෙරළ බඩ ප්‍රදේශවල පෘතුගීසීන්ගේ මර්ධනයට ඔවුන් ගොදුරු වූයේ කෲර වද හිංසා මැදය.

මේ මර්ධනය නිසා දහස් ගණන් යෝනක සරණාගතයෝ කන්ද උඩරට රාජධානියට පළාගියහ. කන්ද උඩරට රජුන්ගේ අනුකම්පාව ලද මේ පිරිස් අති විශාල වශයෙන් හාරිස්පත්තුව, දුම්බර මාතලේ, ගම්පොල, මාවනැල්ල හා රුවන්වැල්ල වැනි ප්‍රදේශවල ස්ථිර පදිංචිකරුවෝ වූහ. මෙසේ සංක්‍රමණය වූ බොහෝ දෙනා සිංහල කාන්තාවන් සමඟ විවාහ වූ බවද කියනු ලැබේ.

පෘතුගීසීන් පළවා හැර ලන්දේසීන් වෙරළබඩ ප්‍රදේශ අත්පත් කරගත් පසු මේ යෝනක සරණාගතයන්ගෙන් සැළකිය යුතු පිරිසක් බේරුවල, පුත්තලම, ගාල්ල හා මඩකළපුව වැනි ප්‍රදේශවලට ආපසු ගොස් ඇත.
මෙසේ කදුරටට සංක්‍රමණය වූ ඉස්ලාම් භක්තිකයෝ නිදහසේ ඔවුන්ගේ ආගමික කටයුතු කරගෙන ගියහ. එයට කිසිම බාධාවක් සිංහලයන්ගෙන් සිදු නොවීය.

මේ අතර ඕලන්ද පාලකයන්ගේ මර්ධනයට ගොදුරු වූ කතෝලිකයන්ද සැළකිය යුතු පිරිසක් සරණාගතයන් වශයෙන් කඳුරටට ගිය බව වහකෝට්ටේ දේවස්ථාන ඉතිහාසයේ සඳහන් වේ.

අතරින් පතර ඝට්ඨන (1915 මෙන්) ඇති වුවද ඒවා දුරදිග ගියේ නැත. මේ සහශ්‍රකයේ ආරම්භයත් සමඟ (2001) බටහිර (විශේෂයෙන් ඇමරිකානු) උදහසට ලක්වූයේ ඉස්ලාම් භක්තිකයන් බව පැවසීම නිවැරදිය.

සුන්නි හා ෂියා මුස්ලිම් නිකායන් අතර දිගින් දිගට 'ලාවට' පැවැති අරගල උත්සන්න වූයේ ඇමරිකානු දෙවනි බුෂ් පරිපාලනය ඇරඹීමත් සමඟය. මේ නිසා මැදපෙරදිග පසුගිය දස වසර පුරා වැගිරුණු ලේ ප්‍රමාණය කොතෙක්දැයි කියා නිම කළ නොහැකිය. ඉරානයෙන් හා ඇෆ්ගනිස්ථානයෙන් ඇරඹුණු 'සටන් බිම' දැන් අප්‍රිකානු මහද්වීපයටද ලඟා වී ඇත. මේ නිසා ඇතැම් ඉස්ලාම් භක්තිකයන් යුද වදින්නේ අරාපික පෙදෙස්වලටය.



*ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්*
ප්‍රවීණ මාධ්‍යවේදී
**ඇස්.පියසේන**

එක් නිදසුනක් ගෙනහැර පෑ යුතුය. ලෝකයේ විශාලතම බුදු පිළිම තිබුණේ ඇෆ්ගනිස්ථානයේ බාමියන් මිටියාවතේය. 1970 දශකයේ ඒවා ස්වාභාවික ව්‍යසනවලින් ආරක්ෂා කර ගැනීමට යුනෙස්කෝ ආයතනය පියවර ගත්තේය. ඒවා සිදුකරන ලද්දේ ප්‍රංශ හා ඉන්දියානු පුරා විද්‍යාඥයන්ගේ ඒකාබද්ධ සංවිධායක් විසිනි. එහෙත් තිස් වසරකට පසු සිදුවූයේ කුමක්ද?
එදා සෝවියට් දේශයට විරුද්ධව ඇමරිකාව විසින් නිර්මාණය කරන ලද 'තලේබාන්' නමැති කුරිරු ත්‍රස්තවාදී කණ්ඩායම් දැන් සටන් කරන්නේ ඇමරිකාවට විරුද්ධවයි.

11 වන පිටට

ප්‍රසිද්ධ දැන්වීම

ඕස්ට්‍රේලියාවට බෝට්ටුවෙන් පැමිණෙන්නේද?
ඇති වාසියක් නැත



Australian Government

වීසා බලපත්‍රයක් නැතිව ඔබ ඕස්ට්‍රේලියාවට එන්න උත්සාහ කලහොත් අපි:

- ඔබගේ අයදුම් පත්‍රය සලකා බලන්නේ නාවුරු හෝ පපුවා නිව් ගිනි වලය
- ඔබ සරණාගත කඳවුරක සිටිනවාට වඩා ඉක්මණින් ඔබගේ අයදුම්පත සලකා බලන්නේ නැත
- පවුලේ අය හට අනුග්‍රහය ලබාදෙන අවස්ථාව ලබා දෙන්නේ නැත
- ඕස්ට්‍රේලියාව තුලම නැවත පදිංචිවන බවට තහවුරුවක් ලබා දෙන්නේ නැත

මිනිසුන් ජාවාරම් කිරීමේ ඇති අනතුරු සම්බන්ධ වැඩිදුර විස්තර www.youtube.com/user/notopeoplesmuggling හි මිනිස් ජාවාරමට නැත යන යූටියුබ් චැනලය ඔස්සේ බලා ගත හැක